අඟුණකොළපැළැස්ස බන්ධනාගාරය තුළ සිදුවූ දිවි තොර කරගැනීමක් බවට කියැවෙන සිදුවීමක්, අරුණ (11/15) සහ දිවයින (11/15) වාර්තා කර තිබුණි. මෙම සිදුවීම දිවි තොර කරගැනීමක් යැයි කියැවුණද, මහජන ලැදියාවට අදාළ වන පුවතක් බැවින්, දිවි තොර කරගත් ආකාරය ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය අවබෝධ කරගත හැකිය.

එසේ වූවත්, දිවි තොර කරගැනීමක් වාර්තා කිරීමේදී, ඒ ඔස්සේ ඇති විය හැකි සෘණාත්මක බලපෑම පිළිබඳ මාධ්‍ය සවිඥාණික විය යුතුය. එවැනි බලපෑම් අවම කිරීමට ගත හැකි එක් පියවරක් වන්නේ, මෙවැනි පුවත් වාර්තාවන් හා උපකාරක අංක සඳහන් කිරීමයි. ශ්‍රී ලංකාවේ මානසික සෞඛ්‍ය ගැටළු සහ උපදේශනය සඳහා වෙන්වූ උපකාරක සේවා කිහිපයක්ම ඇති අතර, ඒ පිළිබඳ ජනතාව දැනුවත් කිරීම තුළින් අනුකාරක දිවි තොර කරගැනීම් වළක්වා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.

විශේෂයෙන්ම මහජන ලැදියාවක් සහිත පුවත්වල දිවි තොර කරගත් ආකාරය දැක්වීමට ඉඩකඩ ඇති බැවින් ද, එවැනි පුවත් හා උපකාරක අංක සඳහන් කිරීම අත්‍යාවශ්‍ය නොවන්නේ දැයි අප විමසිය යුතුය.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL...